

# හද රිදවන මතක සුවඳ

## 1

**රෝහිත මුණසිංහ**
ප්‍රංශයේ සිට

''ජ.වි.පෙ. සැඟවුණ ඉතිහාසයෙන් බිඳක්" යනුවෙන් මා මෙම කෘතිය නම් කළ ද මෙම සටහන් පෙළ ලියුවේ 'හද රිදවන මතක සුවඳ' නමිනි. ජනතා විමුක්ති පෙරමුණට අදාළ වූ මහා ඉතිහාසයෙන් බිඳක් හෝ සටහන් කර තැබීම වැදගත් වෙතැයි මට සිතුණි. එසේම මේ ජීවිතයේදී මට හමු වූ හොඳම මිනිසුන් ඇසුරු කිරීමට අවස්ථාව ලැබ, විවිධාකාර වූ අභියෝගවලට ද අනතුරුවලට ද මුහුණ දෙමින් ගතකළ මගේ ජීවිතයේ හොඳම කාලය ද එය වන බැවින් තාවකාලිකව යටපත් වී ඇති එම මතක පුබුදුවාලමින් යළි යළිත් ආවර්ජනය කිරීම පවා මානසික සතුටක් සේ දැනිණ.

ශ්‍රී ලංකාවේ ධනේෂ්වර පංතියේ බූදලයක් වූ රාජ්‍ය බලයට අභියෝග කරන ලද සන්නද්ධ කැරලි දෙකක් සිදුවූයේ 1971 දී සහ 1987-89 වර්ෂයන්හිදී ය. මෙම සන්නද්ධ අරගල දෙකටම නායකත්වය සපයන ලද්දේ ජනතා විමුක්ති පෙරමුණ විසිනි. මෙම අරගල අවස්ථා දෙකේදී ම එයට සහභාගි වූ අති බහුතරය පුරුෂ පක්ෂය වුවද, සැලකිය යුතු මට්ටමක කාන්තා නියෝජනයක් ද විය.

1971 දී සිදුවූ කැරැල්ලේ දී කැරලිකරුවන්ගේ සාහසිකත්වය ඉතාම අවම මට්ටමක පැවති අතර රාජ්‍ය හමුදාවන්ගේ විශේෂයෙන් ශ්‍රී ලංකා පොලීසියේ සාහසිකත්වය හා කෲරත්වය ඉහළ මට්ටමක

සොයුරිය තරම් ඇය ප්‍රසිද්ධ නොවූවාසේම එතරම් සිහිපත් කිරීම හා සැමරුම්වලට ද භාජනය නොවූවා ය. හොඳින් අලෙවි කළහැකි සිද්ධිවලට ඉහළම ප්‍රචාරක වාසියක් ලබා ගන්නා දේශපාලනයේ පුගුප්සාජනක ස්වභාවය එව මුත් විප්ලවවාදී ක්‍රියාකාරිත්වය අතින් සුජාතා හඳගම, ප්‍රේමවතී මනම්පේරි සොයුරියට වඩා බොහෝ ඉදිරියෙන් සිටියාය යන්න සාධාරණ කියමනකි.


පක්ෂයට සෘජුව සම්බන්ධ වී වැඩ කිරීම නිසා අත්අඩංගුවට පත් වූ හා මර්ධනයට ලක් වූ සොයුරියන් සිටිසේම සිය පවුලේ සාමාජිකයන් ජ.වි. පෙරමුණේ වූ නිසාම මර්ධනයට ලක් වූ සොයුරියෝ ද උන්හ. කිසිම සැමරුමකට හෝ සිහිපත් කිරීමකට ලක් නොවන ඔවුන්ගේ නාමයන් නිකම්ම නිකම් යටපත්ව ගොස් ඇත්තේ කාලය වැලිතලා පැමිණ යටපත් කර දමන්නටත් පෙර ය. පාර්ලිමේන්තු බෝම්බ සිද්ධියට චූදිතයා වී මහත් ප්‍රසිද්ධියට පත් 'අජිත් කුමාර' සොයුරාගේ බිරිඳ එවැන්නියකි. ඇයට දිවි පිදීමට සිදු වූයේ සිය සැමියාගේ දේශපාලන ක්‍රියාකාරිත්වය හේතුවෙනි. ජ.වි.පෙ. උදෙසා ඒ සා අවදානම් කාර්යයකට ඉදිරිපත් වූ, සිය ප්‍රියාදර බිරිඳ සදාකාලයට අහිමිකර ගත්තා වූ, පසුව ජ.වි.පෙ පළාත් සභා මන්ත්‍රීවරයෙකු වූ අජිත් කුමාර, අද පක්‍ෂයේ නැත.

1970 දී පත් වූ 'සමගි පෙරමුණ' රජයේ අමාත්‍යවරිය වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රොස්මිඩ් පෙදෙසේ වූ නිවසට ප්‍රහාර එල්ලකර ඇය අත්අඩංගුවට ගැනීම සඳහා කුමන්ත්‍රනය කළේ යයි චෝදනා ලැබූ පිරිසට තරුණියන් හතරදෙනෙකු අයත් වූහ. ඔවුහු ලීනා අයිරින්, ලීලා සෙනෙවිරත්න, නන්දසීලි හා හේමශ්‍රියා නම් වූහ. සිරගත දිවියෙන් නිදහස ලැබූ පසු මේ සිව්දෙනාගෙන් ක්‍රියාකාරී දේශපාලනයට එළඹුනේ දෙදෙනෙකු පමණි. ඒ කොළඹ සරසවියේ උපාධි අපේක්ෂිකාවන්ව සිටි නන්දසීලි හා හේමශ්‍රියා යන දෙදෙනාය. මින් නන්දසීලි සොයුරිය ජ.වි.පෙ. සමාජවාදී කාන්තා සංගමයේ ඉදිරි ක්‍රියාකාරිනියක වූ අතර (දැන් ඇය පළාත් සභා මන්ත්‍රිනියකි) හේමශ්‍රියා සොයුරිය ද දිගටම පක්ෂයේ රැඳී උන්නා ය.

අප 'හේමක්කා' නමින් ඇමතූ ඇය ශරීර ප්‍රමාණයෙන් ඉතා කුඩා, තැන්පත්, නිහඬ ගතිගුණ ඇත්තියකි. 71 අප්‍රේල් මහ නඩුවේ විනිශ්වයකරුවෙකු වූ ඒ. සී. අලස් මහතා විසින් ලියන ලද 'අප්‍රේල් කැරැල්ල' කෘතියේ ද 'හේමශ්‍රියා' ගැන සඳහනක් තිබේ.

-මෙන්න බලන්න සිරිමාවෝ අත්අඩංගුවට ගන්න ගියපු ගෑනිගෙ සයිස් එක. සිරිමාවෝගෙ එක අතක්ම මෙයයි විතර ඇති."

විහිළුවට තහළුවට ළැදි තල්පාවිල නිමල් සහෝදරයා එසේ කියූවිට හේමක්කා නිහඬව සිනාසී කර බා ගත්තේ ලජ්ජාවෙන් මෙනි.




ජනතා විමුක්ති පෙරමුණ ප්‍රසිද්ධ දේශපාලනයට අවතීර්ණ වී ගාල්ල තුරු මැතිවරණයට හා සංවර්ධන සභා ආදියට ඉදිරිපත් වී මැතිවරණ දේශපාලනයේ නියැලෙන්නට වූ විට මාතර දිස්ත්‍රික්කයේ පක්ෂයේ වැඩ සඳහා වැඩිම සහෝදරියන් පිරිසක් සම්බන්ධ වූයේ අකුරැස්ස හා කඹුරුපිටිය යන ආසන දෙකිනි.

ඇමතිවරියගේ නිවසට පහර දී ඇය අතඅඩංගුවට ගැනීමට සූදානම් වූ විප්ලවවාදී රතුහට කණ්ඩායමකට එක්වීමට තරම් එඩිතරකමක් හා දිරියක් තිබූ, ජ්‍යේෂ්ටත්වයෙන්, උගත්කමින් හා අත්දැකීම්වලින් ද පිරි හේමශියා හෙවත් හේමක්කා පක්ෂයේ වැඩට සහභාගි වූයේ යම්කිසි උපේක්ෂා සහගත බවකින් හා උකටලී බවකිනැයි මට නොයෙක් වර හැඟී ගොස් තිබිණ. 71 අරගලයේදී පොලිස් අත්අඩංගුවට පත්ව පසු කලෙක නිදහස් වූ සහෝදරියන් විවාහ වී මව්වරුන්ද වී පවුල් ජීවිත ගතකරද්දී හේමක්කා පසු වූයේ අවිවාහකවය. තමනට වඩා බොහෝ සෙයින් බාල වූ ගමගේ නංගී, හේවගේ නංගී, රමණී, ලීලා ප්‍රසාදිකා, චාන්දිනී වැනි සහෝදරියන්ගේ ලොකු අක්කා මෙන් වූ හේමක්කා ඔවුන්ටත් පිටුපසින් සිට වැඩ කරද්දී මාතර දිස්ත්‍රික්කයේ කාන්තා නායිකාව වූයේ බුද්ධි අක්කා ය. 71 පොලිස් අත්අඩංගුවට පත් වී රාජ්‍ය මර්ධනයට මුහුණ දුන් ඕ තොමෝ නමින් කුසුමා බුද්ධිකෝරාල නම් වූවා ය.

1971 දී පත් වූ ජේ. ආර්. ජයවර්ධනගේ ධර්මිෂ්ඨ රජය 'අපරාධ යුක්ති විනිශ්වය කොමිෂන් සභා පනත' බලරහිත කෙලෙන් ජ.වි.පෙට එරෙහිව පනවා තිබූ තහනම් නිශ්ක්‍රිය වී සියලු දේශපාලන සිරකරුවන්ට නිදහස ලැබිණ.ඉන්පසු ප්‍රසිද්ධ රැස්වීම් හා ජනහමු සේම අධ්‍යාපන පංති පහ සහ අධ්‍යාපන කඳවුරකට මම ද සහභාගි වීමි. එය නම් කෙනෙකුට විඳගත හැකි විරල අත්දැකීමකි. පුරා සතියක්ම පැවැත්වෙන අධ්‍යාපන කඳවුරේ පන්ති හෙවත් දේශන පටන් ගන්නේ අලුයම පහටය. මුහුණකට සෝදා සූදානම් වීම සඳහා අප පිබිදිය යුත්තේ පාන්දර හතරට ය. වැසිකිළියට යාමට අවසර ලැබුණේ සහෝදරියන්ට පමණි. තිස් දෙනෙකුන් වූ පිරිමි අප මළපහ කිරීමට යායුතු වූයේ වල් බිහි වූ කුරුඳු මූකලානටය. ඇඟපත ගැහෙන සීතලේ රාත්‍රියේ වට පිනිවලින් තෙත් වී ඇති බැදි අකුල් පීරාගෙන යාම දුෂ්කර ක්‍රියාවක් විය. එවිටත් පවතින තිත්ත කරුවලේ කොතැනක හෝ ඇන බා ගත්තේ සර්පයෙකුවත් දෂ්ට කරාවීදැයි යන බියෙනි. අතපය හා මුහුණකට සෝදා ගැනීමට අයිස් මෙන් සීතල ජලය ගලාගිය ඇළට බැසීමද දඬුවමක් සේ විය. පාතරාසය පාන් කාලක් හා හොදි ස්වල්පයකි. දවල්ට කෑවේ කරවල හොදීයි බතුයි නම් රෑට බත් හා කරවල හොදිය. ඉඳහිට වට්ටක්කා හොද්දක් ලැබිණ. උදෑසන පහට පටන් ගන්නා පන්ති අවසන් වූයේ රාත්‍රී දහයට ය. ඉන්පසුව රෑ කෑම ගත් වහාම මුළු දවසේම වාඩි වී සිටි පැදුරේම ඇලවී නිදා ගනිමු.

අධ්‍යාපන කඳවුරේ 'ධනේශ්වරක්‍රමයේ අර්බුදය' නම් වූ පළමු දේශනය කරන ලද්දේ බුද්ධි අක්කා විසිනි. 'ඉන්ද්‍රියානු ව්‍යාප්තවාදය' නම් වූ පංතිය ඒ වෙනකොට ඉවත්කොට තිබූ අතර, පැරණි 'වමේ ව්‍යාපාරයේ ඉතිහාසය' නම් වූ දෙවැනි පංතිය කරන ලද්දේ මාතර දිස්ත්‍රික් ලේකම්වරයා වූ මුණසිංහ සහෝදරයා විසිනි. 'සමාජවාදී ආර්ථික විද්‍යාව' පංතිය කරන ලද්දේ ද ඔහු විසින් ම ය. 71 කැරැල්ලේ දී පොලිස් අත්අඩංගුවට පත් වූ විට දරුණු පහරදීම්වලට ලක් වූ හේතුවෙන් ඒ වනවිටත් කිසියම් ශරීරාබාධයකට ගොදුරුව සිටි ඔහුට හිටි ගමන් උදරයේ මස්පිඩු ගැහෙන්න පටන්ගන්නා රෝගයක් තිබූ බැවින් පැයකට දෙතුන් වතාවක් මිනිත්තු දෙක තුනකට දේශනය නතර කිරීමට සිදුවෙයි. කඳවුරේ සිටි බොහෝ දෙනෙකුට හොඳම 'අල්ලා ගිය' හෙවත් 'නැගලා ගිය' පන්තිය වූයේ පැරණි වමේ ව්‍යාපාරයේ ඉතිහාසයයි.

අකුරැස්ස, කොමියුනිස්ට් පක්ෂ නායක එස්. ඒ. වික්‍රමසිංහ මහතාගේ රතු බලකොටුවය. කඹුරුපිටිය, ඊලියන් නානායක්කාර මහතාගේය. හක්මන ප්‍රේමලාල් කුමාරසිරි වැනි රතු නායකයන් ගොඩනැගූ බලකොටුවය. පැරණි වමේ පාවාදීම්වලට එරෙහිව ගොඩනගන ලද්දා වූ නව වමේ ක්‍රියාකාරිනයන් වන අප හට දේශපාලන දැනුමින් හොඳින් සන්නද්ධ නොවී මේ ඇට්ටකුනා වූ කොමියුනිස්ට්, සමසමාජකාරයන් සිටි ආසනවල වැඩකිරීම පහසු වූයේ නැත. පැරණි වමේ ව්‍යාපර ගැන අප මෙතෙක් නොදැන උන් කරුණු අධ්‍යාපන කඳවුරේදී දැනගත් පසු අප තුළ පැන නැගුණේ එළියට ගිය වහාම මේ දැනුම උරගා බැලීමේ ආශාව හා හදිසියයි. හෙවත් පැරණි කොමියුනිස්ට්, සමසමාජකාරයන් හා වාග් සංග්‍රාමයක පැටලී අප ලබා ගත් නව දැනුම නැමැති සටන් ක්‍රම භාවිතාවේ යොදවා ඇට්ටි හැලෙන්නට දීමේ තදියමයි.

අධ්‍යාපන කඳවුරේ 4 වැනි පංතිය පවත්වන ලද්දේ 'තල්පාවිල ධර්මේ' සහෝදරයා විසින් ය. 'අප ගත යුතු මඟ නම් වූ එම පංතියේ

*71 කැරැල්ලේ දී පොලිස් අත්අඩංගුවට පත් වූ විට දරුණු පහරදීම්වලට ලක් වූ හේතුවෙන් ඒ වනවිටත් කිසියම් ශරීරාබාධයකට ගොදුරුව සිටි ඔහුට හිටි ගමන් උදරයේ මස්පිඩු ගැහෙන්න පටන්ගන්නා රෝගයක් තිබූ බැවින් පැයකට දෙතුන් වතාවක් මිනිත්තු දෙක තුනකට දේශනය නතර කිරීමට සිදුවෙයි.*

අපට ගැනීමට සිදුවන මඟ කුමක්දැයි තේරුම් ගත හැකිවූයේ අවසානයේදී ය. ඉඳහිට විහිළු තහළු කරමින් 'දර්ශනය' පංතිය පැවැත් වූ 'වෙල්ලපුලි' හා සැසඳු විට ධර්මෙ සහෝදරයා අපහට පෙනීගියේ ආඥාදායකයෙකු ලෙසිනි. ඒ වනවිට පුරා දින පහක් පමණ උදේ පාන්දර පහේ පටන් රාත්‍රී දහය වනතුරු ගෙබිම එලූ පැදුරුවල හා ගෝනි පඩංගුවල එක දිගටම වාඩි වී සිටි බැවින් බොහෝ දෙනෙකුගේ කොඳු හා දෙපා කකියන්නට පටන්ගෙන තිබිණ. එබැවින් අප සිටියේ එක් එක් පහසු ඉරියව්වලින් ඉඳගෙනය. ධර්මෙ සහෝදරයා අපහට එසේ සිටීමට ඉඩ නොදුන්නාය. ඇඟපත සෘජුව තබාගෙන නිවැරදිව වාඩිවී සිටින්නැයි ඔහු හැමවිටකම මතක් කළේ විධානයක ස්වරූපයෙනි. ඔහු තදගති ඇති සර පරුෂ අයෙකු ලෙස මට මෙන්ම අන් අයටද සිතුණාට සැකක් නැති. සාමාන්‍ය ඇසුරේදී ඔහු කොතරම් හොඳ සොහොයුරෙකු දැයි මට තේරුම් ගියේ පසු කලෙකදී ය.

භීෂන යුගය යයි නම් දැරූ කාලය ඇරඹීමේ පෙරනිමිත්ත ධර්මෙ සහෝදරයාගේ බිහිසුණු මරණය යයි මම සිතමි.

නීත්‍යානුකූල තත්වයක් යටතේ කළ හැකි සියලුම දේශපාලන ක්‍රියාකාරකම්වලට තහංචි පනවා පක්ෂයක් අසාධාරණ ලෙස තහනම් කොට ඔවුන් රහසිගත දේශපාලනයට තල්ලු කර දැමූවිට නීත්‍යානුකූල නොවන ආකාරයට කටයුතු කිරීමට සිදුවීම අරුමයක් නොවේ. ධර්මෙ සහෝදරයා අභීත විප්ලවවාදියෙකු වුව පක්ෂය විසින් එවැනි කාර්යයකට ඔහු වැනි සහෝදරයෙකු යොදවා නොගත යුතුව තිබුණි.

ධර්මෙ සහෝදරයා තමා කරන්නට ගිය කාරිය සාර්ථක කරගත් නමුදු මෝටර් සයිකලය පණ නංවාගත නොහැකි වූයෙන් පලායාමට නොහැකි විය. ප්‍රදේශවාසීන් විසින් වටකර අල්ලා පහර දී පොලිසියට භාරදෙන ලදුව එහිදී ද දරුණු පහරදීම්වලට ලක් වූ ඔහු රෝහලකට ඇතුලත් කිරීමෙන් පසු මිය ගියේය. පවුලේ ඥාතීන් වෙත මිනිය භාර දුන්නද අවමගුල් කටයුතු සිදු කිරීමට ලබාදෙන ලද්දේ පැය හතක කාලයක් පමණි.

ඔහුට අවසන් ගෞරව දැක්වීමට යාමට මට උවමනා වුවද තාත්තා (පක්ෂයේ තාත්තා) මා වැළැක්වීය. -පුතා යන එක සුදුසු නෑ. ගමේ අය ඇර මරණෙට පිටින් එන්නේ කව්ද කියලා පොලිසිය බලාගෙන ඉදීවි. මම ගිහිල්ල ඇවිල්ල විස්තර කියන්නම්. මම නාකි මිනිහනේ." තාත්තා පැවසී ය.

ධර්මිෂ්ඨ වෙස් මුහුණක් දමාගත් ජේ. ආර්. ගේ අධර්මිෂ්ඨ රජය ජ.වි.පෙ. මර්ධනය කිරීමට කැස කවද්දී පක්ෂයේ දේශපාලය නව මඟකට ප්‍රවිශ්ට වන පෙර නිමිති පහළවෙමින් තිබුණේ ධර්මෙගේ මරණයටත් බොහෝ කලින්ය. ආසන කමිටු සාමාජිකයන් වූ අප කැඳවූ දිස්ත්‍රික් ලේකකම් මුණසිංහ සහෝදරයා විශේෂ දේශනයක් පැවැත්වී ය.

-අද මේ සහෝදරවරු වෙනත් අයට කොකු ගහලා පක්ෂයට බන්දවා ගන්නවා වගේ 71ට කලින් අපිත් ඒ දෙයම කළා. අරගලයෙන් පස්සේ අහම්බෙන් වගේ මම ඉතුරු උනත් මම විහින් පක්ෂයට බන්දවා ගත්ත සමහර සහෝදරවරු මැරුණා. ඉන් එක සහෝදරයෙකුගෙ අම්මා කෙනෙක් දවසක් මම දැකලා ඔළුවෙ අත්දෙක ගහගෙන මහෙම කිව්වා. -උඹ මගේ කොල්ලා විප්ලව කරන්න අරන් ගියා. ඌ නිරපරාදේ මැරුණා. උඹ යහතින් ඉන්නවා. උඹට හෙණ ගහන්න ඕනා." ඒ වගේ මැරණ වෙනත් සහෝදරවරුන්ගේ අම්මලා මගේ මූණට එහෙම නොකිව්වත් එහෙම හිතන්නැති. මේ සහෝදරවරුනට ත් ඒ වගේ දේවල් සිද්ධ වෙන්න පුළුවන්. මේක ජීවිතයත් මරණයත් අතර සටහනක්. මේ සහෝදරවරුන්ගේ කාගෙහරි හිතේ දෙගිඩියාවක් තියෙනවා නම් අද උනත් පක්ෂයෙන් අයින් වෙලා යන්න. අපි තරහා නෑ.

මතු සම්බන්ධයි